**ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය - 2013**

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1995 අංක 29 දරන ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතන පනතේ 19 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1:2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1:3 විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැළසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරා ගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

**ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 02**

සමාලෝචිත වර්ෂය තුළ මුදල් ගලායාම් සහ ගලාඒම් පිළිබිඹු වන පරිදි ප්‍රමිතියට අනුකූලව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කර නොතිබූ අතර පිළියෙල කර තිබුණු මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පහත දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) වර්ෂය තුළදී ව්‍යාපෘති දෙකකින් ලද රු.2,529,547,742 ක් වටිනා වත්කම්, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේදී ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ මුදල් ලෙස පෙන්නුම් කර තිබුණි.

(ආ) පසුගිය වර්ෂයේදී 21 වන සියවසට උසස් අධ්‍යාපන ව්‍යාපෘතියෙන් ආයතනයට ලැබුණු රු.3,568,211 ක වත්කම් සමාලෝචිත වර්ෂයේදී ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ වත්කම් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුළත් කර තිබුණි.

(ඇ) පසුගිය වර්ෂයන්ට අදාලව සමාලෝචිත වර්ෂයේදී සමුච්චිත ලාභයට ගැලපීම් කරන ලද ක්ෂය වෙන්කිරීම් හා සමුච්චිත අරමුදලට කරන ලද අනෙකුත් ගැලපීම්ද ඇතුළුව එකතුව රු.573,525,100 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේදී සමාලෝචිත වර්ෂයේ අලාභයට ගැලපීම් කර තිබුණි.

(ඈ) මුදල් ගලායෑම් හා ගලාඒම්වලට අදාල නොවන ඉකුත් වර්ෂ වැරදි නිවැරදි කිරීම්, ව්‍යාපෘතිවලින් වත්කම් ලැබීම් හා වෙනත් පැහැදිලි නොකළ ගණුදෙණු ඇතුළත්ව රු.1,273,790,250 ක ගැලපීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය වටිනාකමක් නිශ්චය කර නැති, ආයතනයට එරෙහිව කම්කරු උසාවිවල පවරා ඇති නඩු 3ක් හා මානව හිමිකම් කොමිෂන් සභාවට කර ඇති පැමිණිලි 7 ක් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) අධ්‍යයන කාර්යය මණ්ඩලයේ නිලධාරීන් 03 දෙනෙකු නිවාඩු ලබාගෙන විදේශගත වී ඇති අතර, ගිවිසුම් කඩ කිරීම හේතුවෙන් ඔවුන්ගෙන් ආයතනයට අයවිය යුතු රු.1,526,314 ක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) ලබුදුව උසස් තාක්ෂණ ආයතනයේ සේවයේ නිරතව සිට 2013 ජූනි මස සිට නොවැම්බර් දක්වා වැටුප් රහිත නිවාඩු ලබා සිටි නිලධාරිනියකගේ සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල සඳහා දායක මුදල් ලෙස රු.31,447 ක් බැර කර තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයට අදාළ වැරදි නිවැරදි කිරීම් අතීතානුයෝගීව සමුච්චිත අරමුදලට ගැලපීම් සිදුකර තිබුණු නමුත් එයට අනුකූලව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පූර්ව වර්ෂ සංඛ්‍යාවන් සංශෝධනය කර නොතිබුණි.

(ඉ) වත්කමක් භාවිතය සඳහා සුදුසු තත්ත්වයට පත්කල අවස්ථාවේ සිට වත්කමක ක්ෂය කිරීම ආරම්භ කළ යුතු වුවත්, එයට පටහැනිව වත්කම් මිලදීගත් වර්ෂයේ ක්ෂය නොකිරීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කර තිබුණි.

**2.2.3 ලැබිය යුතු ගිණුම්**

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ ආයතනයෙහි සේවයෙන් ඉවත් වී ඇති නිලධාරීන් 7 දෙනෙකු හා වැඩ තහනමට ලක් වී ඇති නිලධාරියෙකු වෙත ලබා දී තිබු එකතුව රු. 495,441 ක ආපදා ණය ශේෂය හා එයට අදාල පොළිය අදාල පාර්ශවයන්ගෙන් අය කරගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 2010 දෙසැම්බර් 10 දිනැති අංක 01/2010 දරන වෙළඳ තීරු බදු හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛයේ (1) (ඉ) වගන්තිය | වසර 12 ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් මෙම යෝජනා ක්‍රමය අනුව සහනදායී මෝටර් රථ ආනයන බලපත්‍ර ලබා ගැනීමට සුදුසුකම් ලැබිය යුතු වුවද, සලකා බලන ලද වසර 12 ක කාලය තුළ පෞද්ගලික අවශ්‍යතාවක් සඳහා වසර 1 ක වැටුප් රහිත නිවාඩු ලබාගෙන තිබුණු නිලධාරියකුට ද සහනදායී මෝටර් රථ ආනයන බලපත්‍රයක් නිකුත් කර තිබුණි. |
| (ආ) | 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.8.9. වගන්තිය හා 1997 ජනවාරි 24 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 116 | උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ අනියම් කම්කරුවන් තිදෙනෙකු අමාත්‍යාංශයේ රාජකාරී සඳහා යොදවා තිබුණු අතර, මේ සඳහා ආයතනය විසින් 2013 දෙසැම්බර් 31 දිනට රු.623,720 ක වේතන ගෙවීම්කර තිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 135 | 2013 වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය බලතල පවරා නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xix පරිච්ඡේදයේ 5.2.1 උප වගන්තිය | නිලනිවාසවල පදිංචිව සිටින නිලධාරීන්ගේ මූලික වැටුපෙන් සියයට 10 ක් හා විවාහක නම් කාලත්‍රයාගේ මූලික වැටුපෙන් සියයට 2 1/2 ක්ද ලෙස මුළු කුලිය වශයෙන් මූලික වැටුපෙන් සියයට 12 1/2 ක් අය කළ යුතු වුවද ලබුදූව උසස් තාක්ෂණ ආයතනයේ හිටපු අධ්‍යක්ෂ 2012 මාර්තු 05 දින සිට 2013 මාර්තු 25 දින දක්වා නිල නිවාසයේ පදිංචිව සිටීම වෙනුවෙන් එසේ අය කිරීමට කටයුතු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, ආයතනයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.46,681,748 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු.108,514,236 ක ඌනතාවයක් විය. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.61,832,488 කින් අඩුවීම සඳහා පුහුණු හා ඇගයීම් වියදම් රු.2,957,062 කින් අඩු වීමද, 2013 වර්ෂයේ සිට වත්කම් ක්‍රමක්ෂය කිරීමද විශේෂයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) උසස් තාක්ෂණ ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන පාඨමාලා සඳහා 2013 වර්ෂයේ දී බඳවාගන්නා ලද ප්‍රතිශතය පෙර වර්ෂය හා සැසඳීමේදී සියයට 18 කින් අඩු වී තිබුණි.

(ආ) 2013 වර්ෂයේ දෙවන අර්ධ වර්ෂය තුළ උසස් තාක්ෂණ ආයතන විසින් පැවැත්වූ උසස් ජාතික පාඨමාලා 12 කට අදාල විභාගවලින් සමත්වීමේ සමස්ත ප්‍රතිශතය සියයට 48 කි.

### 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ අම්පාර, මට්ටක්කුලිය, ලබුදූව, බදුල්ල, මහනුවර, කෑගල්ල, යාපනය, අනුරාධපුර, මඩකලපුව, සමන්තුරේ, තංගල්ල, රත්නපුර, වව්නියා සහ නයිවල යන උසස් තාක්ෂණ ආයතන සතු ගොඩනැගිලි පිහිටි ඉඩම් 2013 දෙසැම්බර් 31 දින දක්වා ආයතනයට පවරා ගෙන නොතිබුණි.

### 4.3 මතභේදයට තුඩු දෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ තනතුරු 02 ක් සඳහා විශ්ව විද්‍යාලවල සේවය කරන ආචාර්යවරුන් බඳවාගෙන තිබුණු අතර, ඒ අනුව එම තනතුරු සඳහා අනුමත බඳවා ගැනීම් පරිපාටිය අනුව හිමි වැටුප හා දීමනා (දළ වශයෙන්) සහ විශ්ව විද්‍යාල වෙත ප්‍රතිපූරණය කළ යුතු වැටුප් අතර ඇති වෙනස්කම් නිසා බඳවා ගැනීම් පරිපාටිය අනුව හිමි වැටුප් පරිමාණයන්ට වඩා රු.1,802,281ක් වැටුප් වශයෙන් 2013 වර්ෂයේදී ගෙවා තිබුණි. එසේම ආයතනයේ අධ්‍යක්ෂවරුන් ආයතනය තුළින්ම

උසස්වීම් මඟින් පත්නොකර තනතුරේ වැටුප් හා දීමනාවලට වඩා වැඩි වැටුප් හා දීමනා සමඟ ද්විතිය පදනම මත බාහිර පාර්ශවයන් බඳවාගැනීම හේතුවෙන් ආයතනයේ උසස්වීම් අපේක්ෂාවෙන් සිටින නිලධාරීන්ට හිමි අවස්ථා අහිමිවන බවද නිරීක්ෂණය කෙරේ.

(ආ) 2013 වර්ෂයේ පාලක සභා රැස්වීම් අංක 15/137 අනුව ද්විතිය පදනම මත පත්කරන ලද නයිවල උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂවරයාට ද්විතිය පදනම මත හිමි වැටුප වෙනුවට සමාලෝචිත වර්ෂයේදී සම්පූර්ණ වැටුප ගෙවා තිබුණි.

(ඇ) “21 වන සියවසට උසස් අධ්‍යාපන ව්‍යාපෘතියේ” මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේදී රු.20,057,993 ක් වටිනා පරිගණක හා මෘදුකාංග ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයට ලබාදී ඇති බව විගණනය වෙත දන්වා ඇතත් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ මූල්‍ය ප්‍රකාශන අනුව එම වටිනාකම රු.18,160,652 ක් විය.

**4.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

2012 දෙසැම්බර් 31 දින ආරම්භ කර 2013 දෙසැම්බර් 31 දිනට අවසන් කිරීමට නියමිතව තිබූ අනුරාධපුර උසස් තාක්ෂණ ආයතනය ඉදිකිරීමේ කටයුතු 2014 ජූලි 31 දින දක්වා අවසන් කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසානයට එහි භෞතික ප්‍රගතිය සියයට 60 ක් වූ අතර මූල්‍ය ප්‍රගතිය සියයට 17 ක් විය.

**4.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

2013 දෙසැම්බර් 31 දිනට අධ්‍යයන කාර්ය මණ්ඩලයට අදාලව අනුමත සේවක සංඛ්‍යාව 264 ක් වූ අතර, එම පුරප්පාඩු සංඛ්‍යාව 41 ක් විය. අනධ්‍යයන කාර්ය මණ්ඩලයට අදාලව අනුමත සේවක සංඛ්‍යාව 292 ක් වූ අතර පුරප්පාඩු සංඛ්‍යාව 57 ක් විය. ඒ අනුව කාර්ය මණ්ඩලයේ සමස්ථ පුරප්පාඩු සංඛ්‍යාව 98 ක් විය.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 සංයුක්ත සැලැස්ම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව සංයුක්ත සැලැස්මේ ඇතුළත් විය යුතු ආයතනයේ සංවිධාන සටහන, පසුගිය වර්ෂ තුනක මෙහෙයුම් ප්‍රතිඵල හා ක්‍රියාකාරී සැලැස්ම (වගකිව යුතු නිලධාරීන්ද සඳහන් කර) මෙම ආයතනයේ සංයුක්ත සැලැස්මෙහි අන්තර්ගත කර නොතිබුණි.

**5.2 ක්‍රියාකාරී සැලැස්ම**

ක්‍රියාකාරී සැලැස්ම සකස් කර තිබුණද, එය වාර්ෂික අයවැය ලේඛණය හා මූල්‍ය ප්‍රකාශන සමඟ සමගාමී නොවූ හෙයින් ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක ඉටුකර ගැනීමේ ප්‍රගතිය පිළිබඳව පරීක්ෂා කළ නොහැකි විය.

**5.3 ප්‍රසම්පාදන සැලැස්ම**

2013 වර්ෂය තුළ රු. 75,094,057 ක ස්ථාවර වත්කම් මිලදී ගැනීම් සිදු කර තිබුණද 2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

2012 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**6. පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධ්‍යක්ෂ ජනරාල්ගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) තොග පාලනය
(ඇ) පුස්තකාල පාලනය
(ඈ) විෂය නිර්දේශ සකස් කිරීම, සිසුන් බඳවා ගැනීම සහ දේශන පැවැත්වීම
(ඉ) නේවාසිකාගාර පාලනය